බස්නාහිර පළාතේ පළාත් සභාව
மேல் மாகாண மாகாண சபை
WESTERN PROVINCE PROVINCIAL COUNCIL

බස්නාහිර පළාතේ පළාත් සභාවේ සියළුම ගරු මන්ත්‍රීවරුන් වෙත,

**සභා රැස්වීම**

2013 සැප්තැම්බර් මස 24 වන දින කල් තැබීම අනුව, බස්නාහිර පළාතේ පළාත් සභාව 2013 ඔක්තෝබර් මස 08 වන දින පෙ.ව. 9.30 ට බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාතේ පළාත් සභා ගොඩනැගිලි පරිශ්‍රයේ සභා ශාලාවේදී රැස්වෙන බව කාරුණිකව දැනුම් දෙමි.

න්‍යාය පත්‍රය මේ සමඟ ඇත.

සුනිල් විජේරත්න,
සභාපති,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2013.09.24 දින,
සභා ලේකම් කාර්යාලය,
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5වන මහළ, B පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

# බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම

## 2013 ඔක්තෝබර් මස 08 වන දින පෙ.ව. 9.30 ට

# න්‍යාය පත්‍රය

I. සභාපතිවරයාගේ නිවේදන
II. ලිපි ලේඛන පිළිගැන්වීම
III. කාරක සභා වාර්තා පිළිගැන්වීම
IV. පෙත්සම්
V. ප්‍රශ්න

01. ගරු සරත් පතිරණ මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමාගෙන් 2013.09.24 දින අසන ලද ප්‍රශ්නය:

(ප්‍ර/V(1)13/14)

අ. බ.ප./කැළ/හේනේගම විද්‍යාලයේ විදුහල්පතිතුමා විසින් පාසැල් වත්තේ තිබූ තේක්ක, ලුණුමිදෙල්ල ඇතුළු ගස් 17 ක් කපා ලී මෝලකට යැවූ බව ඔබතුමා දන්නේද ?

ආ. i මෙම ගස් ඉවත් කිරීම සඳහා අනුමැතිය ලබා දුන් නිලධාරීහු කවුරුන්ද ?
ii අවසර ලබාදුන් ලිපිය සභාගත කල හැකිද ?

ඇ. i මෙම විදුහලේ වාර්ෂිකව පවත්වනු ලැබූ හේමප්‍රතිභා සැණකෙළියේ 2011, 2012 වර්ෂයන් සඳහා ලැබුණු ආදායම කොපමණද ?
ii එම මුදල් තැන්පත් කර ඇත්තේ කිනම් ගිණුමකටද ?

ඈ. i 2012 වර්ෂයේ "හේමප්‍රතිභා" සැණකෙළියේ ආරාධිතයෙකු ලෙස සහභාගී වූ රජයේ අමාත්‍යවරයෙකු ලබා දුන් රුපියල් අනූ දහසේ චෙක්පත ගිණුම් කර ඇත්තේ කිනම් ගිණුමකද ?

උ. i මෙම උත්සවයේ ආරාධිතයෙකු වූ ප්‍රාදේශීය සභාවක සභාපතිවරයෙකු ඇතුළු වෙනත් ආරාධිතයන් ලබා දුන් මුදල් තැන්පත් කරන ලද්දේ කිනම් ගිණුමකද ?

ඌ. i පළාත් සභා මන්ත්‍රී ප්‍රතිපාදන මගින් මෙම විදුහලට ලබා දුන් බස් රථය සඳහා අමතර රුපියල් ලක්ෂ දහ තුනක මුදලක් විවිධ පුද්ගලයන්ගෙන් එකතු කල බව ඔබතුමා දන්නේද ?
ii එම මුදලට සිදුවූයේ කුමක්ද ?

එ. i බ.ප./කැළ/හේනේගම විද්‍යාලයේ විදුහල්පතිවරයා පිළිබඳ පැවැත්වූ විගණන පරීක්ෂණයේ නිර්දේශය කුමක්ද ?
ii එම විගණන වාර්තාව සභාගත කල හැකිද ?
iii නො එසේ නම් ඒ මන්ද ?

## VI. නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා

## VII. අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ

## VIII. පෞද්ගලික පැහැදිලි කිරීම

## IX. පොදු කටයුතු

01. ගරු මාර්ග සංවර්ධන, සත්ව නිෂ්පාදන හා සංවර්ධන, නිවාස හා ඉදිකිරීම්, ධීවර හා සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා (බ.ප.)

*'2013 අංක ................ දරණ බස්නාහිර පළාතේ පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරිය (සංශෝධන) ප්‍රඥප්තිය.'*

(දෙවනවර කියැවීම)

[ප්‍රඥප්ති කෙටුම්පත පළමුවර කියැවීම 2013.06.18 දින සිදුකර ඇත.]

## X . පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු

01. **ගරු ලලිත් එල්ලාවල මන්ත්‍රීතුමා :**

"වර්තමානයේ පවතින පළාත් සභා හා පාර්ලිමේන්තු අනුපාත මැතිවරණ ක්‍රමය ඉදිරිපත් වන අපේක්ෂකයන්ට මෙන්ම ඡන්ද දායකයන්ටද ඉතා අපහසු ගැටළුකාරී මැතිවරණ ක්‍රමයක් වන බැවින්, ඉදිරියේදී පවත්වන සියළු මැතිවරණ නව පළාත් පාලන මැතිවරණ ක්‍රමය මෙන්, පළාත් සභා කොට්ඨාශ මට්ටමින්ද, පාර්ලිමේන්තු මැතිවරණය ආසන මට්ටමින්ද, පැවැත්වීමට කටයුතු කළ යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව රජයට යෝජනා කර සිටියි."

(යෝ/v (01)13/04 )

**02. ගරු සිරිකමල් පිලිෂියන් ද සිල්වා මන්ත්‍රීතුමා :**

"ලංකා විදුලිබල මණ්ඩලයේ වාර්ෂිකව සිදුවන අධික පාඩුව අවම කර ගැනීම සඳහා යැයි පවසමින් පසු ගිය අප්‍රේල් මස විදුලි බිල වැඩි කරමින් එම පාඩුවට මුදල් මහජනතාවගෙන් අය කර ගැනීමට කටයුතු කරන ලදී. වර්ෂාව නොලැබීම නිසා ජලාශ හිඳීයාම හේතුවෙන් රටේ විදුලිබල අවශ්‍යතාවයෙන් සියයට 18 ක(18%) ප්‍රමාණයක් ජල විදුලිය මගින් විදුලිය නිපදවීමට සිදුවූ බවත්, පෞද්ගලික විදුලි බලාගාර මගින් වැඩි මිලට විදුලිය මිලදී ගැනීමට හා වෙනත් ක්‍රම මගින් විදුලිය නිපදවීමට ද සිදුවූ බවත් ප්‍රකාශ විය. දැනට මාස කීපයක සිට ඇද හැලෙන ධාරානිපාත වර්ෂාව හේතුවෙන් ජලාශ පිරී ඉතිරී ගොස් සියයට 85 ක (85%) විදුලිය නිපදවීම ජලවිදුලි බලාගාර මගින් සිදු වේ. එමනිසා වැඩි කරන ලද විදුලි බිල වහාම අඩු කර මහජනතාව වෙත සහන සලසන මෙන් මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව රජය වෙත යෝජනා කර සිටියි"

(යෝ/v (01)13/05 )

## XI . සභාව කල් තැබීම

කේ.එච්.ඩී.කේ.සමරකෝන්
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභ

2013.09.24 දින
සභා ලේකම් කාර්යාලය,
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5වන මහල, B පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.